# සාමාන්‍ය සමයේ දස සය වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය සලමොන්ගේ ප්‍රඥාව 12: 13, 16–19

*සලමොන්ගේ ප්‍රඥාව නමැති පොතෙන් උපුටා ගත් කොටසකි.*

"පාපයට පසු මනස්ථාපනය වීම ගැන දෙවියන් වහන්සේ
තම දරුවන්ට බලාපොරොත්තුවක් දෙන සේක."

ඔබ කිසි දාක අසාධාරණ ලෙස විනිශ්චය කෙලෙහි යයි ඔබ විසින් ම ඔප්පු කළ යුතු වූ ද, සියල්ල ගැන සලකන්නා වූ ද, ඔබ හැර අන් දෙවි කෙනෙකු නැත. ඔබේ යුක්තියේ මුල රඳා ඇත්තේ බලයෙහි ය. සියල්ලන් කෙරෙහි ආධිපත්‍යය ඔබට ඇති බැවින් ඔබ සියල්ලන්ට කාරුණික ය. ඔබේ අධිපති බලය ගැන ප්‍රශ්න කරන විට ඔබ තමන් ශක්තිය පෙන්වන සේක. මේ බව දන්න අයගේ අහංකාරය ඔබ අනාවරණය කරන සේක. එහෙත්, ඔබ තමන් බල මහිමය පාන විට විනිශ්චයේ දී මෘදු ය. ඔබ ඉතා කාරුණික ව අප පාලනය කරන සේක. මන්ද, ඔබ කැමැත්ත පෙන්වන විට ඔබේ බලය එහි ඇත්තේ ය. ඔබ මෙසේ ක්‍රියා කිරීමෙන් දැහැමි මිනිසා සිය අසල්වැසියන්ට කෙසේ කාරුණික ව සිටිය යුතු දැ යි ඔබ තමන් සෙනඟට පාඩමක් උගන්වා ඇත. පාපයට පසු පසුතැවී සිත් හරවා ගැනීම ගැන මනා බලාපොරොත්තුවක් ඔබ තමන් දරුවන්ට දුන් සේක.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 86: 5–6, 9–10, 15–16

පිළිතුර : සමිඳුනි, යහපත් වූ ඔබ අපට කමා කරන සේක.

ගීය : මාගේ සමිඳුනි, ඔබ යහපත් ය. ඔබ කමා කරන සේක.
ඔබට අයැදින සියල්ලන්ට තිර පෙම බහුල ව ප්‍රදානය කරන සේක.
සමිඳුනි, මාගේ අයැදුමට සවන් දුන මැනව.
පිහිට පතමින් මා කරන අයැදුමට කන් දුන මැනව.

මාගේ සමිඳුනි, ඔබ මැවූ සියලු ජාතීහු
ඔබ වෙත පැමිණ ඔබට නමදින්නෝ ය.
ඔව්හු ඔබේ නාමය පසසමින් ඔබට ගරු කරන්නෝ ය.
ඔබ බලසම්පන්න ය, අරුමපුදුම දේ කරන සේක.
ඔබ පමණක් දෙවිඳාණෝ ය.

මාගේ සමිඳුනි, ඔබ මෙත් සිත් ඇති
දයානුකම්පාව පාන දෙවිඳාණෝ ය.
ඉවසන සුළු කරුණාවෙන් සහ
විශ්වාසවන්තකමින් සපිරි තැනැත් වහන්සේ ය.
මා වෙත හැරී මට අනුකම්පා කළ මැනව,
මා ශක්තිමත් කොට මා ගැළෙවුව මැනව
මන්ද, මාගේ මව ඔබට සේවය කළ පරිදි මම ද ඔබට සේවය කරමි.

## දෙවන දේව ප්‍රකාශනය — රෝම 8: 26–27

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"වචනවලින් කිව නොහැකි අපේ සුසුම්ලෑම්වලදී
ශුද්ධාත්මයාණන් වහන්සේම අප වෙනුවෙන් අයදින සේක."

එලෙස ම ශුද්ධාත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකමේ දී අපට ආධාර දෙන සේක. නිසි ලෙස යාච්ඤා කළ යුත්තේ කෙසේ දැ යි අපි නොදනිමු. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ ම වචනවලින් කිය නොහැකි සුසුම්ලෑම්වලින් දෙවියන් වහන්සේ වෙත අප වෙනුවෙන් අයැදින සේක. අප සිත්සතන්හි ඇති සියල්ල විමසා බලන දෙවියන් වහන්සේ ශුද්ධාත්මයාණන්ගේ අයැදුම් දන්නා සේක. මන්ද, ශුද්ධාත්මයාණන්, සැදැහැවතුන් උදෙසා කරන අයැදුම් දේව අදහසට එකඟ වන බැවිනි.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද මතෙව් 11: 25

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයටත් පොළොවටත් ස්වාමින් වන පියාණන් වහන්ස,
ඔබ වහන්සේ මේ කරුණු පැණවතුන් හා නැණවතුන් කෙරෙන්
ආවරණය කොට බාලයන්ට අනාවරණය කළ හෙයින්
ඔබට තුති පුදමි.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 13: 24–43 හෝ 13: 24–30

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"අස්වැන්න නෙළන කාලය වන තුරු
තිරිඟු හා කිරිඳි වැඩෙන්නට ඉඩ හරින්න."

ජේසුස් වහන්සේ තවත් උපමාවක් මෙසේ වදාළ සේක. "ස්වර්ග රාජ්‍යය හොඳ බීජ වපුළ මිනිසකුට සමාන ය. මිනිසුන් නිදා සිටිය දී ඔහුගේ සතුරා අවුත් තිරිඟු අතර කිරිඳි වපුරා ගියේ ය. තිරිඟු පැළ නැගී, කරල් හට ගත් කළ කිරිඳිත් මතු විය. එවිට ගෘහ මූලිකයාගේ දාසයෝ අවුත්, 'ස්වාමිනි, ඔබේ කෙතෙහි ඔබ හොඳ බීජ වපුළා නොවේද? එසේනම් කිරිඳි කොහෙන් දැ'යි ඔහුගෙන් ඇසූහ. 'මෙය සතුරෙකුගේ වැඩක් ය'යි ඔහු කී ය. එවිට දාසයෝ කතා කොට 'එසේ නම් අප ගොස් ඒවා උදුරා දමන්න දැ'යි ඔහුගෙන් ඇසූහ. එහෙත් ඔහු උත්තර දෙමින්, 'එසේ නොකරන්න, ඔබ කිරිඳි උදුරද්දී ඒ සමග තිරිඟුත් ඉදිරෙන්නට පුළුවන. ගොයම් කපන කාලය දක්වා දෙවගේ ම එකට වැඩෙන්න හරින්න. ඉන්පසු ගොයම් කපන කාලයේ දී පළමු කොට කිරිඳි එකතු කොට දවන පිණිස මිටි බඳින්න. තිරිඟු මාගේ අටුවේ රුස් කරන්නැ යි කපන්නන්ට කියමි'යි කීවේය."

(උන් වහන්සේ ඔවුන් ඉදිරියෙහි තවත් උපමාවක් වදාරමින් "ස්වර්ග රාජ්‍යය මෙබඳු ය. එක්තරා මිනිසෙක් සිය කෙතෙහි අබ ඇටයක් වපුළේ ය. එය සියලු ම බීජවලට වඩා කුඩා වුවත්, වැඩුණු කළ හැම පලා වර්ගවලට වඩා විශාල වී, අහසේ කුරුල්ලන් අවුත් එහි අතුවල ලැගුම් ගන්න තරම් ලොකු ගසක් වන්නේ ය"යි කී සේක.

උන් වහන්සේ තවත් උපමාවක් වදාරමින් "ස්ත්‍රියක විසින් පිටි නැළි තුනක් සහමුලින් ම පිපෙන තුරු එහි දමන ලද මුහුන් පිඩකට ස්වර්ග රාජ්‍යය සමාන ය"යි කී සේක.

ජේසුස් වහන්සේ මේ සියල්ල ජනකායට උපමා මගින් පැවසූ සේක. උපමාවක් නැති ව කිසිවක් ඔවුන්ට නොවදාළ සේක. මෙසේ වූයේ: "මම උපමා මගින් කතා කරමි, ලෝකයේ මුල සිට ම රහස්ව තිබුණු දේ හෙළි කරන්නෙමි" යි දිවැසිවරයන් ලවා පවසන ලද කරුණු ඉටු වන පිණිස ය.

එවිට උන් වහන්සේ ජනකාය යන්න හැර ගෙට වැඩිය සේක. ශ්‍රාවකයෝ උන් වහන්සේ වෙත අවුත් "කෙතේ කිරිඳි පිළිබඳ උපමාව අපට පහදා දුන මැනව" යි කී හ. උන් වහන්සේ උත්තර දෙමින්, මෙසේ වදාළ සේක. "හොඳ බීජ වපුරන තැනැත්තේ නම්, මනුෂ්‍ය–පුත්‍රයාණෝය: කෙත නම් ලෝකය ය: හොඳ බීජ නම් රාජ්‍යයට අයිති අය ය: කිරිඳි නම් නපුරාට අයිති අය ය. ඒවා වපුළ සතුරා නම් යක්ෂයා ය. කපන කාලය නම් යුගාන්තය ය: කපන්නෝ නම් දේව දූතයෝ ය. කිරිඳි එක් කොට ගින්නෙහි දවන්නේ යම් සේ ද, යුගාන්තයේ දී එසේ ම වන්නේ ය. මනුෂ්‍ය පුත්‍රයාණෝ ස්වකීය දූතයන් එවන සේක. ඔව්හු උන් වහන්සේගේ රාජ්‍යයේ බාධා උපදවන සියල්ල ද අදම්ටුකම් කරන්නන් ද එක් කොට ගිනි උඳුනෙහි හෙළන්නෝ ය. එහි දී වැළපීම ද දත්මිටි කෑම ද වන්නේ ය. එකල දැහැමි අය තම පියාණන් වහන්සේගේ රාජ්‍යයෙහි සූර්යයා මෙන් බබළන්නෝ ය. සවන් ඇත්තේ සවන් දෙත් වා!")

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

*(වරහන් අතර කොටස අත් හළ හැකි ය.)*



# “ගොයම් කපන කාලය දක්වා දෙවගේ ම එකට වැඩෙන්න හරින්න.”

*සාමාන්‍ය සමයේ දහසය වන ඉරුදින - 23-07-2017*

## හැඳින්වීම

ලෝකයේ නපුර පවතින්නේ ඇයි? දෙවියන් වහන්සේට සියලු බලය ඇත්නම් උන්වහන්සේ නපුර ඉවත් නොකරන්නේ ඇයි? උන්වහන්සේ නපුරු මිනිසුන්ව විනාශ නොකරන්නේ ඇයි? බොහෝ දෙනෙක් මේ ප්‍රශ්න අසති. දෙවියන් කෙරෙහි විශ්වාස නොකරන අය ඒ අතරින් ප්‍රධාන වේ. මේවාට පිළිතුරක් අද කියවීම් තුළ ඇත. එය පිළිගැනීමට බොහො විට අප සූදානම් නැත. දෙවියන් වහන්සේගේ අසීමිත දයාවෙන් සහ ඉවසීමෙන් නිවැරදි ප්‍රයෝජනය ගන්නට අප උත්සහ කරනවාද? නපුරු මිනිසුන් ගැන කතා කරන අපට අපේ නපුරුකම් පෙනෙනවාද? මනස්ථාපනය වීමට ආරාධනයක් ද අද කියවීම් තුළ ඇත. තාවකාලික සතුටක්, පහසුවක් වෙනුවෙන් ඒ ආරාධනය පිළිනොගෙන නොසිටින්න. ඔබ තවම ප්‍රමාද වැඩි නැත. එහෙත් යම් දිනක, ඔබ නොසිතන මොහොතක, ඔබ ප්‍රමාද වැඩි වනු ඇත.

## දේව වචනය

**සලමොන්ගේ ප්‍රඥාව 12:13, 16-19**

**ගීතාවලිය 86:5-6, 9-10, 15-16**

**රෝම 8:26-27**

**මතෙව් 13:24-43**

පළමු කියවීම උපුටා ගෙන ඇත්තේ සලමොන්ගේ ප්‍රඥාව පොතෙනි. අදට නියමිත පාඨය දෙවියන් වහන්සේගේ ඉවසිලිවන්ත බව සහ දයාවන්ත බව අවධාරණය කරයි. මේ තේමාව සුවිශේෂයේ එන කිරිදි පිළිබඳ උපමාවේ පණිවිඩය සමග හොඳින් සම්බන්ධ වේ. දෙවියන් වහන්සේගේ විනිශ්චය සාධාරණ ය. මෘදු ය. උන්වහන්සේට සියලු බලය ඇතත් පව්කාරයින්ට පවා කරුණාව දක්වන සේක. උන්වහන්සේගේ මේ දයාවන්ත ගතිය නිසා මනස්ථාපනය වී නැවත හැරී ඒම ගැන බලාපොරොත්තුවක් අපට ලැබී තිබේ.

සුවිශේෂයේ එන ප්‍රධාන උපමාව පළමු කියවීමේ තේමාව තව ඉදිරියට රැගෙන යයි. දෙවියන් වහන්සේ නපුරු මිනිසුන්ව විනාශ නොකරන්නේ මන්ද යන ප්‍රශ්නය එදා සමාජයටත් තිබුණි. එමෙන් ම පව්කාරයින් ඇසුරු කිරීම පිළිබඳව ජේසුන් වහන්සේට චෝදනා එල්ල විය. තිරිඟු සහ කිරිදි උපමාවෙන් උන්වහන්සේ පෙන්වා දෙන්නේ යහපත් සහ අයහපත් ලෙස මිනිසුන් බෙදා වෙන් කිරීම දෙවියන් වහන්සේට පමණක් අයිති කාරණයක් බවයි. උන්වහන්සේ එසේ කරන්නේ අවසාන දවසේ දී ය. එතෙක් උන්වහන්සේ මිනිසුන්ට කාලය දෙන සේක. මුළුමනින් ම යහපත් යැයි කිවහැකි කිසිවෙක් අප අතර නැත. එමනිසා උන්වහන්සේ ලබා දී ඇති කාලය අප සැමටම ප්‍රයෝජනවත් වේ.



පළමු කියවීමෙන් සහ සුවිශේෂයෙන් මතු කරන එක් කාරණයක් වන මනස්ථාපනය වීම සඳහා ඇති උදව් ගැන පාවුලු තුමා දෙවන කියවීමෙන් උපදෙස් දෙයි. අප දුර්වල නිසා අපේ පාපී බවින් මිදීමට

ශුද්ධාත්මයාණන් වහන්සේ අපට සහය දෙන සේක. නිවැරදිව යාච්ඤා කළ යුත්තේ කෙසේද කියාවත් අප නොදන්නා නිසා ශුද්ධාත්මයාණෝ අප තුළ හිඳිමින් අපේ ඉල්ලීම් දෙවියන් වහන්සේ වෙතට යොමු කරන සේක.

## මෙනෙහි කිරීම

මතක ඇති කාලයේ සිට තිරිඟු සහ කිරිඳි පිළිබඳ කියවන විට මා සිතට කා වැදුණේ දෙවියන් වහන්සේගේ ඉවසීම සහ කරුණාවයි. උන්වහන්සේ "නරක මිනිස්සුන්ට දඬුවම් දෙන්නට මේ තරම් ප්‍රමාද වෙන්නේ ඇයි" කියන පොදු මහා ප්‍රශ්නයට මේ උපමාව තුළ පිළිතුරක් තිබෙන බව මම දැන ගත්තෙමි. එමනිසා අයහපත දකින විට, අයහපත් මිනිසුන් මුණ ගැසෙන විට කලබල නොවී ඉවසීමෙන් කටයුතු කළ යුතු බව ඉගෙන ගත්තෙමි. ඒ කෙසේ වුවත් නරක මිනිසුන් ගැන තරහක්, කලකිරීමක් හිතේ ඇති වුණු අවස්ථා නැතැයි කිව නොහැක. මට හිතෙන විදිහට මේ අප බොහෝ දෙනෙකුට පොදු අත්දැකීමකි.

මේ සිතුවිල්ල තුළ ලොකු අඩුපාඩුවක් තිබෙන බව මට ඊයේ පෙරේදා වන තුරු වැටහුණේ නැත. දෙවියන් වහන්සේ අයහපත් මිනිසුන් ගැන තවදුරටත් ඉවසීමෙන් කටයුතු කරන නිසා මමත් එසේ කරන්නට උත්සහ කරමි. **එසේ කිරීම තුළ කෙළින් නොකියවෙන යටි අරුතක් තිබේ. එනම් "මම හොඳ කෙනෙකි" යනුයි. මා සිතන්නේ මා තිරිඟු ගසක් කියාය. ඒ බව මා කලින් ම නිගමනය කර ඇත. එමෙන්ම මම මගේ වටේ සිටින අය දෙස බලා ඔවුන්ව තිරිඟු සහ කිරිඳි ලෙස වර්ග කර ඇත. මට ඒ අයිතිය ලැබුණේ කොහෙන්ද?** ඇත්තෙන්ම එසේ කිරීමට අයිතියක් හෝ සුදුසුකමක් මට නැත.



එහෙම නම් අවසානයේ ගින්නට යැමට නියමිත නරක මිනිසුන්ව අප හඳුනා ගන්නේ කොහොමද? අපට එය කළ නොහැක. අපට ඉතා උඩඟු, අහංකාර, ලෞකිකත්වයේ ඇලී ගැලී සිටින ලෙස පෙනෙන කෙනෙක් දෙවියන් වහන්සේගේ කෙතේ තිරිඟු ගසක් විය හැක. එසේම ඉතා අහිංසක, නිහතමානී, නිතර ම සේවයට කැපවුණු කෙනෙක් අප නොදන්නවා වුනත් කිරිඳි ගසක් විය හැක. **අප විනිශ්චය කරන්නේ මිනිසුන්ගේ වචන සහ ක්‍රියා ය. ඔවුන්ගේ සිතුවිලි සහ අරමුණු ගැන අපට ඇත්තේ අනුමාන පමණි. කෙනෙකුගේ තීරණයකට බලපාන පරිසරයේ සාධක ගැන අපට ඇත්තේ අල්ප දැනුමකි. සමහර විට අප දන්නේ ම නැත. එහෙත් අපි විනිශ්චය කරමු.**

එහෙත් දෙවියන් වහන්සේ හැම කෙනෙක් ගැනම සියලු දේ දන්නා සේක. එමනිසා උන්වහන්සේට සාධාරණ ලෙස විනිශ්චය කිරීමට පුළුවන. අද පළමු කියවීම පවසන්නේත් උන්වහන්සේ මෘදු ලෙස විනිශ්චය කරන, කාරුණික කෙනෙක් බවයි. දෙවියන් වහන්සේ විනිශ්චය කරන්නේ එක් එක් පුද්ගලයාට මුහුණ දෙන්නට සිදුවූ තත්වයන්, ලැබුණු ආභාෂයන්, හැදුණු වැඩුණු පරිසරය, අත් විඳි පහසුකම් ආදී සියලු කාරණා සළකා බලමිනි. මේ දේවල් ගැන අප දන්නේ මොනවාද? ඉතිං අපේ විනිශ්චයන් සාධාරණ වන්නේ කොහොමද?

මේ කෙසේ කීවත්, නපුරු දේ සිදුවෙනවා දකින විට අපට කේන්ති යැම වළක්වා ගත නොහැක. ඈත අතීතයේ පටන් ම මානව සමාජය තුළ යුක්තිය සහ සාධාරණය වෙනුවෙන් පිපාසයක් තිබුණි. ඒ සඳහා විවිධ ශිෂ්ටාචාරයන් තුළ පාලකයන් විසින් විවිධ නීති රීති සහ සංකල්පයන් ගොඩ නැගුණි. නමුත් මේ කිසිවක් ප්‍රේමය හා සමාව දීම මත ගොඩනැගුණු ඒවා නොවේ. එමනිසා ම අපට දෙවියන් වහන්සේගේ ක්‍රමය තේරුම් ගැනීමට අපහසු බවක් ඇත.

මිනිසුන්ගේ ක්‍රමයට අනුව මට හෝ මගේ පවුලේ කෙනෙකුට හිරිහැරයක් කළොත් පෙරළා රිදවීමට අයිතියක් මට ඇත. අඩුම ගානේ නීතිය ඉදිරියට ගොස් අදාළ පුද්ගලයාට දඬුවම් කරවීමට හෝ මට ඉඩ කඩ ඇත. එය මගේ අයිතියකි. සමහර විට අපට සිතෙන්නේ අපරාධකරුවන්ට දඬුවම් කිරීම අපේ යුතුකමක් ලෙසිනි. ටෙලි නාට්‍ය, චිත්‍රපට වල වීර චරිත

තුළින් අපට පෙන්වන්නේ මේ සංකල්පයයි. මේ කතා වල වීරයෝ යුක්තිය උදෙසා සටන් වදිති. ඒ වෙනුවෙන් ඔවුහු ලේ හෙළති, ජීවිත විනාශ කරති, දේපල සුනු විසුණු කරති, නීතිය පවා කඩ කරති. එහෙත් බලා සිටින අප දිගට ම වීරයාගේ පැත්තේ ය. මන්ද දුෂ්ටයා විනාශ කළ යුතුමය. අපත් බලා සිටින්නේ වීරයා දිනන තෙක් ය. **දුෂ්ටයා අවසන් හුස්ම හෙළන මොහොත අපේ සැනසුම් සුසුම් හෙළන මොහොතයි. සාධාරණය ඉෂ්ට වීම ගැන අපි සතුටු වෙමු. චිත්‍රපට වල මෙන් ත්‍රාසජනක අයුරින් නොවුණත් මෙවැනි දේ අපේ ජීවිත වලත් වෙන්නේ නැද්ද? කාට හරි දඬුවමක් ලැබෙන තුරු අපි බලාගෙන ඉන්නේ නැද්ද?**

දෙවියන් වහන්සේ යුක්තිය පසිඳලන්නේ පළිගැනීමෙන් නොව ප්‍රේමයෙන් සහ සමාව දීමෙනි. උන්වහන්සේ අයහපත් යැයි සළකා කිසිවෙකුව අත් හැර නොදමන සේක. ඔවුන්ට නිවැරදි මගට ඒමට කාලය දෙන සේක. අස්වනු නෙළන කාලය තෙක් ම කිරිඳි වලට ද තිරිඟු සමඟ වැඩෙන්න ඉඩ දෙන්නේ එහෙයිනි.



අපට තවත් ප්‍රශ්නයක් පැන නැගිය හැක. කිරිඳි වලට ද තිරිඟු අතර ම වැඩෙන්නට ඉඩ දීමෙන් තිරිඟු වල වැඩීමට බාධාවක් ඇති විය නොහැකිද? එපමණක් නොව අස්වනු නෙළන කාලය එන තෙක් සේවකයෝ ද අවට සිටින අය ද ස්වාමියාට දොස් කියති. සතුරෙක් පැමිණ කිරිඳි වපුරා යෑම එක අතකින් ස්වාමියාට විශාල ලැජ්ජාවකි. ඒ කිරිඳි විනාශ නොකර සිටීම තවත් ලැජ්ජාවකි. මිනිසුන් ස්වාමියාට සිනාසෙනු ඇත. අද දවසේත් ලෝකයේ සිදුවන අපරාධ දෙස බලා දෙවි කෙනෙක් නැතැයි සිනාසෙන මිනිසුන් කොතෙක්ද?

එහෙත් ස්වාමියා ඒ සියලු දෙනාට වඩා නුවණක්කාරය. කිරිඳි තිබුණා කියා තිරුඟු වල වැඩීම බාල වීමට ඔහු ඉඩ නොහරියි. ජලය සහ පොහොර උරා ගැනීමට ඇතිවන තරඟයෙන් ජය ගැනීමට අවශ්‍ය ශක්තිය තිරිඟු වලට ඇති බව ඔහු දනී. එසේ නොවන කල ඔහු ඒවාට වැඩිපුර අවධානය යොමු කර අවශ්‍ය ආධාර ලබා දෙයි. කෙසේ හෝ අවසානයේ දී ධාන්‍ය අස්වැන්නට අමතරව අවශ්‍ය නම් ගිනි ඇවිලීම සඳහා යොදා ගත හැකි කිරිඳි තොගයක් ද ස්වාමියාට ලැබේ. එහෙයින් මුලින් සතුරාට පරාජය වූවා සේ පෙනුණු ස්වාමියා අවසානයේ ජයගනී.

මෙම උපමාව ගැන මෙනෙහි කරද්දී අප එතරම් අවධානයක් යොමු නොකරන කාරණයක් වෙයි. එනම් සතුරාගේ ක්‍රියාවයි. මේ සතුරා නම් යක්ෂයා බව ජේසුන් වහන්සේ තේරුම් කර දෙන සේක. අද බොහෝ දෙනෙකුට යක්ෂයා සංකල්පයක් පමණි. සමහර කිතුනුවන්ට පවා යක්ෂයා ප්‍රබන්ධයකි. එහෙත් ජේසුන් වහන්සේ අවස්ථා ගණනාවක දී ම යක්ෂයා ගැන අපට උගන්වන සේක. ඌ බොරුවේ පියා බව උන්වහන්සේ පැවසූව සේක (ජුවාම් 8:44). අද දවසේ දී යක්ෂයා වපුරන වල් බීජ හෙවත් බොරු මොනවාද? අප ඒවාට අහුවෙනවාද?

අවාසනාවකට යක්ෂයාගේ බොරු අද මුළු ලෝකය පුරා පැතිරී ඇත. රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත්, වෙබ් අඩවි, පොත්පත් .... ආදී මොන දේ ගත්තත් අපට අසන්නට දකින්නට ලැබෙන්නේ අපව දෙවියන් වහන්සේගෙන් ඈත් කරවන දේය. මේ බොරු ඉතා ලස්සනය. ඒවා බොරු යැයි අපට සිතෙන්නේ නැති තරමට ඒවා ආකර්ශණීය ය. එමනිසා අපත් ඒවාට හසුවී රැල්ලේ දුවමු. අද අපට ඇසෙන තරමක් ඇත්තේ අපව තව තවත් ලෞකිකත්වයට ළං කරන දේවල් නොවේද? මිනිසුන්ගෙන් උපදෙස් ලැබෙන්නේ ලෝකය තුළ තවත් උසස් වන්නට දියුණු වන්නට මිසක් දෙවියන් වහන්සේව හොයා යෑමට නෙමේ නේද? **යක්ෂයාගේ බීජ හඳුනා ගත හැකි වන්නේ දෙවියන් වහන්සේගේ බීජ වන දේව වචනයට වැඩිපුර සමීප වීමෙනි. ලෝකයෙන් ඇසෙන දේට වඩා වැඩියෙන් දෙවියන් වහන්සේගෙන් එන පණිවිඩයට සවන් දෙන්නට ඔබ උත්සහ කරනවාද? එසේ නැත්නම් ගමන ලෙහෙසි නැත.**

අද සුවිශේෂයේ තව කෙටි උපමා දෙකක් ඇත. ඒවායේ ක්‍රිස්තුන් වහන්සේ දේව රාජ්‍යය අබ ඇටයකට සහ මුහුන් පිඩකට උපමා කරන සේක. ඇයි උන්වහන්සේ දේව රාජ්‍යය වැනි බලවත් විශාල දෙයක්

ඉතා කුඩා දෙයකට උපමා කරන්නේ? අපට වරදින්නේ අප ලෝකයේ ක්‍රමයට සිතන නිසාය. අප කැමති ලොකු දේවල් වලට ය. ජේසුන් වහන්සේ මෙහිදී පෙන්වා දෙන්නේ දේව රාජ්‍යයේ ක්‍රියාකාරිත්වය සිදුවන ආකාරයයි. එය පටන් ගන්නේ ඉතා කුඩා තැනකින් වන නමුත් මහා විශාල තත්වයකට ළඟා වෙයි.

අවාසනාවකට අප මේ කාරණය තේරුම් ගන්නේ නැත. ජීවිතයේ සුළු සුළු දේ පිළිබඳව අවධානය යොමු කිරීමේ පුරුද්දක් අපට නැත. අප නිතර ම උත්සහ කරන්නේ විශාල දේවල් කිරීමට ය. සමිති සමාගම් වල මෙන් ම මීසම් වල පවා 'පුංචි' වැඩ වලට මිනිසුන් අද්දවා ගැනීමට අසීරුය. එහෙත් පුවත් පත් දැන්වීම් පළ කොට, රූපවාහිනියට දන්වා කරන වැඩසටහන් වලට මිනිසුන් ගලා එති.



**කුඩා දේ ගැන අවධානය යොමු කිරීමට අපට ලෝකය ඉඩ නොදෙයි. ලෝකය අපට නිතර ම උගන්වන්නේ ප්‍රසිද්ධ, විශාල දේ ගැන අවධානය යොමු කිරීමටයි. අපේ පුද්ගලික ජීවිතය තුළ, පවුල තුළ සිදුවන දේ එතරම් වැදගත් නැතැයි අපට දන්වයි. ඒ වෙනුවට රූපවාහිනියේ, අන්තර්ජාලයේ සිදුවන දේ ඉතා වැදගත් යැයි පෙන්නුම් කරයි.** එවිට අපිත් එවැනි ලොකු තලයන් තුළ ජීවත් වීමට, ක්‍රියාකාරී වීමට උත්සහ කරමු. නමුත් දවස පුරා අප ළඟ ම සිටින අය සමග එක වචනයකින්, සිනාවකින්, සිතුවිල්ලකින්, සුළු කාලයකින් කළ හැකි දේ අමතක කරමු. හැමෝම කැමති මම අහවල් ලොකු ව්‍යාපෘතියේ කොටස්කාරයෙක් වුණා යැයි කියන්නටයි. එහෙත් අපේ ළඟම සිටින කෙනාගේ සතුටට, සැනසීමට, ගැලවීමට මම හේතුවක් වුණා යැයි සිතීමට අපට අවශ්‍ය නොවේ.

දේව රාජ්‍යය කුඩා තැනකින් පටන් ගෙන විහිද යයි. ජේසුන් වහන්සේ ශුද්ධවූ සභාව පිහිටුවන්නේ විජාතීන්ට යටත් ව තිබූ දේශයක ජීවත් වූ අප්‍රසිද්ධ මිනිසුන් දොළොස් දෙනෙක් සමගිනි. නමුත් අද වන විට උන්වහන්සේගේ ශුභාරංචිය ලෝකය පුරා පැතිරී ගොසිනි.

තමන් යහපත් හෝ අයහපත් යැයි සිතන කවරෙකුට වුවද අද දින කියවීම් තුළ පණිවිඩයක් ඇත. යහපත් යැයි සිතන අය (අපි ඔක්කොම වගේ මේ ගොඩේ නේද?) ලෝකයේ ක්‍රමයෙන් බැහැරව ප්‍රේමය සහ සමාව දීම මුල්කරගත් සාධාරණය පසිඳලීමේ මග අවබෝධ කරගත යුතුව ඇත. **තමන් පව්කාරයින් යැයි සිතන අය මුලින් තමාට ම සමාව දිය යුතුය. මන්ද දෙවියන් වහන්සේ අපට සමාව දෙන නිසාය. මනස්ථාපනය වීමට තවමත් ප්‍රමාද වැඩි නැත.** ඒ සඳහා ශුද්ධාත්මයාණන්ගේ ආධාරය ද අපට ලැබෙන බව පාවුලු තුමා දෙවන කියවීමෙන් උගන්වයි. අවංකව අපේ වැරදි ක්‍රියා ගැන පසුතැවෙන විට ඒ සඳහා යාච්ඤා කළ යුතු අන්දම ද ශුද්ධාත්මයාණන් වහන්සේ අපට පෙන්වා දෙන සේක. උන්වහන්සේ ම අප තුළ හිඳ අපත් සමග යාච්ඤා කරන සේක. බොහෝ විට යාච්ඤාව පිළිබඳව අපට ඇත්තේ 'පොළොව මත සිටින මම' දුර ඇත 'ඉහළ අහසේ සිටින දෙවියන් වහන්සේට කතා කරනවා වැනි හැඟීමකි. එහෙත් දෙවියන් වහන්සේ අප තුළ ම වැඩ සිටින සේක. උන්වහන්සේ අප තුළ ම හිඳිමින් අපට කතා කරන සේක. මොහොතක් නිහඬව උන්වහන්සේට අවධානය යොමු නොකර උන්වහන්සේගේ හඬ සොයා ගත නොහැක.

*"සමිඳුනි, ඔබවහන්සේ මෙත් සිත් ඇති දයානුකම්පාව පාන දෙවිඳාණෝ ය. ඉවසන සුළු කරුණාවෙන් සහ විශ්වාසවන්ත කමින් සපිරි තැනැන්වහන්සේ ය. මා වෙත හැරී මට අනුකම්පා කළ මැනව, මා ශක්තිමත් කොට මා ගැලෙව්ව මැනව. (පිළිතුරු ගීය) "*

irudinasupuwatha@gmail.com